# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2019 අගෝස්තු මස 30 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2019.09.02 දින නිකුත් කරන ලදී)**


## දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 17.00 | තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 සිට 30 දක්වා වගන්ති :*** මේ වගන්ති මඟින් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ ඇති යල් පැන ගොස් ඇති වචන හා යෙදුම්, සමකාලීන තත්ත්වය පිළිඹිබු වන වචන හා යෙදුම්වලින් ප්‍රතියෝජනය කිරීමෙන්, ඒ සංග්‍රහය සංශෝධනය කිරීමට විධිවිධාන සලස්වයි.

## දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.—ඕ. 43/2016

### (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2019 අංක  දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 3, 18අ, 120, 138, 158, 159, 160, 225 සහ 256අ යන වගන්තිවල හැර එහි “ලංකාව” යන වචනය දක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට “ශ්‍රී ලංකාව” යන වචනය ආදේශ කරනු ලැබිය යුතු ය.

19 වන අධිකාරයේ “ලංකාව” යන වචනය “ශ්‍රී ලංකාව” යන වචනය මගින් ප්‍රතියෝජනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19, 115 සහ 120 යන වගන්තිවල හැර එහි “මහරැජින” යන වචනය දක්වෙන සෑම තැනකටම “ජනරජය” යන වචනය ආදේශ කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ “මහරැජින” යන වචනය “ජනරජය” යන වචනය මගින් ප්‍රතියෝජනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“ජනරජය.  12. “ජනරජය” යන වචනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය දක්වේ.”.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ඉවත් කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ආණ්ඩුව.

14. "ආණ්ඩුව" යන වචනයට යම් විස්තරාත්මක නොහොත් වර්ණනාත්මක වචනවලින් හෝ පද සම්බන්ධයෙන් හෝ වෙනයම් අර්ථයක් දක්වා නොමැති අවස්ථාවක එයින් ද "ශ්‍රී ලංකාණ්ඩුව" හෝ "ශ්‍රී ලංකාවේ ආණ්ඩුව" යන යෙදුමෙන් ද, 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද ආණ්ඩුව අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

""මේ දිවයින" සහ "ශ්‍රී ලංකාව".

15. "මේ දිවයින" සහ "ශ්‍රී ලංකාව" යන පිළිවෙලින් වූ වචනවලින් ශ්‍රී ලංකාද්වීපය දැක්වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ජනාධිපතිවරයා.

16. "ජනාධිපතිවරයා" යන වචනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වන අතර, ඔහුගේ ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ කිරීමට යථා පරිදි පත් කරන ලද හෝ නම් කරන ලද යම් තැනැත්තකු ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය එහි (ආ) වන නිදර්ශනය ඉවත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වන වගන්තියේ “යම් ප්‍රඥප්තියක් හෝ” යන වචනවල සිට “ඒ යටතේ වූ රීති හෝ නියෝග” යන වචන දක්වා වන සියලු වචන වෙනුවට “ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකයේ යම් ප්‍රඥප්තියක් හෝ 1946 ලංකා (පාර්ලිමේන්තු ඡන්ද විමසීම්) රාජ සභා ආඥාව යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ රීති හෝ නියෝග” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ “පළමුව” යන වචනයේ සිට “රැජිනගේ නාවුක, යුද්ධ හෝ ගුවන් හමුදාවන්හි අධිකාරලත් සෑම නිලධරයෙක්” යන වචන දක්වා වන සියලු වචන වෙනුවට—

“පළමු ව - ජනාධිපතිවරයා විසින් හෝ ජනාධිපතිවරයාගේ බලය යටතේ ප්‍රදානය කරනු ලැබූ හෝ සාදනු ලැබූ යම් අධිකාරයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් පත් කිරීමේ ක්‍රියාවක් හෝ ප්‍රකාර ශ්‍රී ලංකාවේ යම් ධුරයක් දරන සෑම තැනැත්තෙක්;

දෙවනු ව - ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සෑම සාමාජිකයෙක්;

තෙවනු ව - ශ්‍රී ලංකා ජනරජයේ නාවුක, යුද හෝ ගුවන් හමුදාවන් හි අධිකාරිලත් සෑම නිලධරයෙක්.”,

යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි නිදර්ශනයේ “පොලිස් විදානේ කෙනෙක්” යන වචන වෙනුවට “ග්‍රාම සේවා නිලධාරි කෙනෙක්” යන වචන ආදේශ කිරීමෙන්,

ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ ‘‘භාර්යාවගේ’’ යන වචනය දක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට ‘‘කලත්‍රයාගේ’’ යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය එහි "අග්‍රාණ්ඩුකාරතුමාගේ " යන වචනය වෙනුවට, "ජනාධිපතිවරයාගේ " යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ නිදර්ශනයේ ''ආණ්ඩුවට විරුද්ධව යුද්ධ කිරීමේ'' යන වචන වෙනුවට ''ජනරජයට විරුද්ධව යුද්ධ කිරීමේ'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියේ ''ලංකාවේ හෝ එහි යම් කොටසක හෝ මහරැජිනගේ රාජධානි හෝ දේශ භූමි කිසිවක පරමාධිපත්‍යය මහරැජිනට අහිමි කිරීමට'' යන වචන වෙනුවට ''ශ්‍රී ලංකාවේ හෝ එහි යම් කොටසක හෝ ශ්‍රී ලංකා ජනරජයේ ජනතාවගේ පරමාධිපත්‍යය ඔවුනට අහිමි කිරීමට'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 119 වන වගන්තියේ- ප්‍රධාන ප්‍රඥප්තියේ 119 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "අග්‍රාණ්ඩුකාරවරයාගේ හෝ සෙනෙට් සභිකයකුගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ" යන වචන දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට, "ජනාධිපතිවරයාගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) පැති සටහනේ, "අග්‍රාණ්ඩුකාරවරයා" යන වචනය වෙනුවට, "ජනාධිපතිවරයා" යන වචනය ආදේශ කිරීමෙන්,

එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියේ - ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "මහරැජින කෙරෙහි නොහොත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව කෙරෙහි" යන වචන වෙනුවට, "ජනාධිපතිවරයා කෙරෙහි හෝ ජනරජයේ ආණ්ඩුව කෙරෙහි" යන වචන ආදේශ කිරීමෙන්;

(2) "මහරැජිනගේ යටත් වැසියන්" සහ "වැසියන්ගේ" යන වචන වෙනුවට, පිළිවෙලින් "ශ්‍රී ලංකාවේ ජනතාව" සහ "ජනතාවගේ" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි පැහැදිලි කිරීමේ -

(අ) ''මහරැජින හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව'' යන වචන වෙනුවට ''ජනාධිපතිවරයා හෝ ජනරජයේ ආණ්ඩුව'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ''මහරැජිනගේ යටත් වැසියන් '' සහ ''වැසියන්ගේ''යන වචන වෙනුවට, පිළිවෙළින් ''ශ්‍රී ලංකාවේ ජනතාව'' සහ ''ජනතාවගේ ''යන වචන ආදේශ කිරීමෙන්,

එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 138 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 138 වන වගන්තියේ-

(1) ''ලංකාවේ මහරැජිනගේ ආණ්ඩුව හෝ සෙනෙට් සභාව හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය'' යන වචන වෙනුවට ''ජනරජයේ ආණ්ඩුව හෝ පාර්ලිමේන්තුව'' යන වචන ආදේශ කිරීමෙන් ;සහ

(2) ''ලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයාගේ'' යන වචන වෙනුවට ''ජනරජයේ ජනාධිපතිවරයා'' යන වචන ආදේශ කිරීමෙන්,

එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තියේ ''ලංකාවේ ආණ්ඩුවෙන්'' යන වචන වෙනුවට, ''ජනරජයේ ආණ්ඩුවෙන්'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තියේ ''සෙනෙට් සභාවෙන් හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් හෝ ලංකාවේ විධායක ආණ්ඩුවෙන්'' යන වචන වෙනුවට, ''පාර්ලිමේන්තුවෙන් හෝ ජනරජයේ විධායක ආණ්ඩුවෙන්'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තියේ -

(1) ''සෙනෙට් සභාවෙන් හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් හෝ ලංකාවේ විධායක ආණ්ඩුවෙන් '' යන වචන වෙනුවට ''පාර්ලිමේන්තුවෙන් හෝ ජනරජයේ විධායක ආණ්ඩුවෙන්'' යන වචන ආදේශ කිරීමෙන් ;සහ

(2) නිදර්ශනයේ "අධිනීතිඥවරයෙක්" යන වචන වෙනුවට "නීතිඥවරයෙක්" යන වචනය ආදේශ කිරීමෙන්,

එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තියේ -

(1) "ආණ්ඩුවට" යන වචනය වෙනුවට "ජනරජයට" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(2) පැති සටහනේ "ආණ්ඩුවට" යන වචනය වෙනුවට "ජනරජයට" යන වචනය ආදේශ කිරීමෙන්,

එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 191 වන සහ 192 වන වගන්ති සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 191 වන සහ 192 වන වගන්තිවල "මේ සංග්‍රහය අනුව හෝ එංගලන්තයේ නීතිය අනුව" යන වචන වෙනුවට "මේ සංග්‍රහය අනුව හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ප්‍රඥප්තියක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 225 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 225 වන වගන්තියේ -

(1) "ලංකාණ්ඩුවේ බලය ප්‍රකාර හෝ 1941 අංක 21 දරන ව්‍යවහාර මුදල් ආඥාපනත යටතේ හෝ ශ්‍රී ලංකාවෙහි කාසි නිකුත් කිරීමට අදාළව තත්කාලයෙහි බලපවත්නා වූ යම් ප්‍රඥප්තියක් යටතේ හෝ මහරැජිනගේ රාජධානියේ භූමි ප්‍රදේශවල යම් කොටසක ආණ්ඩුවේ" යන වචන වෙනුවට, "ලංකාණ්ඩුවේ බලය ප්‍රකාර හෝ 1941 අංක 21 දරන ව්‍යවහාර මුදල් ආඥාපනත යටතේ හෝ (422 වන අධිකාරය වූ ) මුදල් නීති පනත යටතේ හෝ ශ්‍රී ලංකාවෙහි කාසි නිකුත් කිරීමට අදාළව තත්කාලයෙහි බලපවත්නා වූ යම් ප්‍රඥප්තියක් යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) "ශ්‍රී ලංකාවේ හෝ මහරැජිනගේ රාජධානි හෝ භූමි ප්‍රදේශවල යම් කොටසක" යන වචන වෙනුවට, "ශ්‍රී ලංකාවේ" යන වචන ආදේශ කිරීමෙන්,

එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 256අ වන වගන්තියේ "ශ්‍රී ලංකාවේ මහරැජිනගේ ආණ්ඩුව සහ මහරැජිනගේ රාජධානි සහ භූමි ප්‍රදේශවල යම් කොටසක ආණ්ඩුව හෝ යම් විදේශයක ආණ්ඩුව ද" යන වචන වෙනුවට "යම් විදේශයක ආණ්ඩුවද" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 256අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 398 වන වගන්තියේ (අ) නිදර්ශනයේ "සිවිල් සේවයෙහි" යන වචන වෙනුවට, "ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 398 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 449 වන වගන්තියේ "කිරීටය" යන වචනය වෙනුවට "රාජ්‍ය " යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 449 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 468 වන වගන්තියේ "මහරැජිනගේ රාජධානි සහ භූමි ප්‍රදේශවල යම් කොටසක හෝ යම් විදේශීය රටක හෝ " යන වචන දක්වෙන සෑම තැනකදීම එම වචන වෙනුවට "ශ්‍රී ලංකාවේ හෝ යම් විදේශීය රටක හෝ " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 468 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 478අ වන වගන්තියේ (2) උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 478අ වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) "මුදල් නෝට්ටුව" යන්නෙන්, 1941 අංක 21 දරන ව්‍යවහාර මුදල් ආඥාපනත හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත හෝ ශ්‍රී ලංකාවෙහි මුදල් නෝට්ටු නිකුත් කිරීම සම්බන්ධයෙන් තත්කාලයෙහි බලපවත්නා යම් ප්‍රඥප්තියක් හෝ යටතේ නිකුත් කරනු ලැබූ මුදල් නෝට්ටුවක් අදහස් වන අතර, යම් විදේශීය රාජ්‍යයක ආණ්ඩුව විසින් නැතහොත් ඒ ආණ්ඩුව වෙනුවෙන් නිකුත් කරනු ලැබූ ද, කවර හෝ නමකින් හඳුන්වනු ලබන්නා වූ ද, මුදල්

නෝට්ටුවකට සමාන තත්ත්වයක වූ ද යම් නෝට්ටුවක් එයට ඇතුළත් වේ.’’.

ප්‍රධාන ප්‍රඥප්තියේ 485 වන වගන්තිය සංශෝධනය කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 485 වන වගන්තියේ “මහරැජිනගේ” යන වචනය වෙනුවට, “ජනරජයේ” යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**31.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.